# හිරුනි හංසිකා දියණිය සුවපත් කරගන්න සහයවන්න







හිරුනි හංසිකා ගමආරච්චි මහනුවර හිල්වුඩ් විද්‍යාලයේ ඉගෙනුම ලැබූ වයස අවුරුදු 20 ක තරුණියකි. එම විදුහලේ ඉගෙනුම ලබමින් සිටින අතරතුර, ඇයගේ මව සයිප්‍රසයේ රැකියාවක නිරතු වූ බැවින් ඇය ද සයිප්‍රසයට ගියාය. ඉන් පසුව සයිප්‍රසයේ වැඩිදුර අධ්‍යාපනය හදාරමින් සිටින විටදී හදිසියේ රෝගාතුරවීම හේතුවෙන් රෝහල් ගත කිරීමෙන් පසුව දැන ගැනීමට ලැබුනේ ඇයගේ මොලයේ ගෙඩියක් ඇති බැවින් හදිසි ශල්‍ය කර්මයක් සිදු කල යුතු බවයි.

බරපතල ලෙස රෝගාතුරව සිටි ඇය 2011 දෙසැම්බර් 18 වන දින හදිසි ශල්‍ය කර්මයකට භාජනය කල අතර දින 18ක් සිහිසුන්ව සිටි ඇය හට වැඩිදුර ශල්‍ය කර්මයක් සිදු කළ යුතු බවත්, එය එම රටේ දී කළ නොහැකි බැවින් ග්‍රීසියේ රෝහලක ශල්‍ය කර්මය සිදු කළ යුතු බවත් සයිප්‍රසයේ වෛද්‍යවරුන්ගේ මතය විය.

එබැවින්, සිහිය ලැබූ ඇය හට ග්‍රීසියේ රෝහලක දී දෙවැනිශල්‍ය කර්මය සිදු කළ අතර, ඉදිරි මාස 3 ඇතුලත නැවත ශල්‍ය කර්මයකට ලක් කළ යුතු බවට වෛද්‍යවරු උපදෙස් දී ඇත. එම ශල්‍ය කර්මය ද ග්‍රීසියේදී සිදු කළ යුතුව ඇත. එම ශල්‍ය කර්මය ද අවසන් වන තෙක් හිස් කබලේ විවෘත කළ කොටස වසා දැමිය නොහැකි බව ප්‍රකාශ කර සිටින බැවින් අද වන විට ඇයගේ හිස් කබලේ කොටසක් සයිප්‍රසයේ රෝහලක සුරැකිව තබා ඇත. අවසන් ශල්‍යකර්මය ද අවසන් වු පසුව එම කොටස නැවත සවි කරනු ඇත.

දෙවැනි ශල්‍යකර්මය අවසානයේ ඇය නැවත වරක් සයිප්‍රසයට ගෙන්වා ගත් නමුත් බරපතල රෝගී තත්ත්වය හේතුවෙන් ලංකාවට කැඳවා ගෙන ඒම අපහසු වී ඇත.

මෙම සියළු ශල්‍යකර්ම සඳහා ඉතා විශාල වියදමක් දැරීමට සිදුවිය. රෝහල් ගාස්තුවලින් කොටසක් මේ වන තෙක් ගෙවා ගත නොහැකිව ඇත. රෝහල් සේවිකාවක් වූ ඇයගේ මවට මෙම වියදම දැරීම ඉතා අපහසු වී ඇත. එසේම, රෝගියාට උවටැන් කිරීමට සිදුවීම හේතුවෙන් මව හට තම රැකියාවට යාම ද නවතා දැමීමට සිදු වී ඇති බැවින් බරපතල මූල්‍ය අපහසුතාවලට මුහුණදීමට සිදු වී ඇත.

එසේම, දැනට ලබා දෙන ප්‍රතිකාර හා ඖෂධ සඳහා ද ඉතා විශාල වියදමක් දැරීමට සිදු වී ඇත. එම ප්‍රතිකාර නොඅඩුව හා අඛණ්ඩව කළ යුතු තත්තවක රෝගියා සිටී.

උසස් අධ්‍යාපනය හදාරමින් සිටින මෙම නව යොවුන් තරුණිය පිළිබඳ ව ඇයගේ මව පත්ව ඇති අසරණ තත්ත්වය ද සැලකිල්ලට ගනිමින්, ඇයගේ ප්‍රතිකාර සඳහා ඔබගේ නොමසුරු ආධාරය


INTERBALKAN
MEDICAL CENTRE
OF THESSALONIKI

Thessaloniki, 18/01/2012

Mrs. Sofia Costa
Ministry of Health
Republic of Cyprus

Dear Mrs. Costa,

In relation to Mr. Camaratchchige Hiru receiving subsidized therapy from the Republic of Cyprus and suffering from ruptured brain arteriovenous malformation, I would like to inform you that the cost of her embolization therapy shall amount to approximately 18,000 Euros per session, due to the fact that large brain malformations should undergo gradual embolization in multiple sessions. The number of sessions required is mainly determined by the size of the malformation and since I have not seen the images of malformation I am not in a position to determine the number of sessions to be performed until the patient is completely cured.

Should further materials and additional surgery be required, the cost of treatment may be higher than the budget prescribed.

The patient may enter Interbalkan Medical Centre on Monday, 23rd January 2012 to undergo a surgical procedure on the next day.

The Physician

(illegible signature)

Dr. Vasilios Katsaridis
Neurosurgeon

REPUBLIC OF CYPRUS

ලබාදෙන මෙන් ද, එම ආධාර රෝගියාගේ නමින් සම්පත් බැංකුවේ ඇති 101253993262 අංක දරණ ගිණුමට බැර කරන මෙන් ද කාරුණිකව ඉල්ලමු. (ඇයගේ වෛද්‍ය වාර්තා මේ සමඟ අමුණා ඇත)

වැඩිදුර තොරතුරු සඳහා -
තලතා ඒකනායක (මවගේ නැගනිය)
29/12 ඩී, වටරුවුම් පාර, මාපනාවතුර
(දුරකථන - 077 791 2114)

ප්‍රමිලා ඒකනායක (මව) - සයිප්‍රසය
(දුරකථන - 0035 79 985 1694)
G.H. Hansika (LKR Account)
101253993262
Sampath Bank




**ආසිරි වනිගරත්න**

## වෙන් වූ මෙට්ට වෙන්ව විසීමට මඟ පාදයි

ඇඳක් තෝරාගන්නා විට (ඔබලා දෙදෙනාට නිදා ගැනීම සඳහා) එම ඇඳ තනි ඇඳක් විය යුතු අතර එහි තිබිය යුත්තේ තනි මෙට්ටයකි. මෙට්ට දෙකක් එකතු කර සකස් කළ නිදන ඇඳක හෝ කුඩා ඇඳවල් දෙකක් එකතු කර සෑදූ ඇඳක දෙදෙනා නිදා ගැනීම අසුභය. ඇඳවල් දෙකක් හෝ මෙට්ට දෙකක් එහි නිදන යුවල අතර අසමඟිය ඇතිකරන නිසා ඔබ කවදාවත් මෙට්ට දෙකක් ඇඳවල් දෙකක් භාවිතා නොකළ යුතුය. දෙදෙනා එකට නිදාගන්නා විට දෙදෙනා නිදාගත යුත්තේ එක ඇඳක හා තනි මෙට්ටයකය.

මෙට්ට දෙකක් හෝ ඇඳවල් දෙකක් එකට ළංකර ඒ මත දෙදෙනා නිදාගැනීම විවාහ ජීවිතයේ අනාගතයට ඉතාම අසුභ බව සැලකෙන්නේ අවසානයේදී එම යුවල වෙන්වීම (දික්කසාදය) සිදු කරන නිසයි.

## නිදන කාමරයේ ගැටුම් වලක්වා ගැනීම

නිදන කාමරවල දැකිය හැකි තවත් විනාශකාරී අංග තදකක් තිබේ. මේ නිසා දෙදෙනා අතර දරුණු වැරදි වැටහීම් ඇතිවේ.

1. ඇඳට ඉහළින් බාලක්යක් තිබීම ඉතා අසුබයි. ඔබලාගේ ඇඳ තිබෙන්නේ බාල්කයක් යට නම් එම ඇඳ එතනින් වෙනත් තැනකට ගෙනියන්න. ඔබට මෙය කළ නොහැකි නම් බාල්කය සංකේතාත්මකව අතුරුදහන් කිරීමට සිවිලිමක් සාදන්න.

2. දොරටු දෙකක් අතර ඇඳ පිහිටා තිබීම ඉතාම අසුභයි. ඇඳ වෙනත් තැනකට අයින් කළයුතුය.

බාල්ක යට නිදා ගැනීම විශේෂයෙන් යුවලකට සුභ ෆෙංෂුඉ නොවන්නේ ඔවුන්ව සංකේතාත්මකව දෙකට කැපීම එයින් සිදුවන නිසාය.

## පාලනය කළනොහැකි දරුවන් හැසිරවීම

ඔබේ දරුවන් සමඟ ඔබට ගැටළු පවතිනවා නම් ඔබේ නිවසේ ෆෙංෂුයි ඔබ පරීක්ෂාකර බැලිය යුතුය. ඔබේ දරුවන්ගේ කාමරයට ඇතුළුයන දොරටුව ටොයිලට් එකට හෝ පඩිපෙළකට කෙලින්ම මුහුණලා තිබෙනවාද කියා බලන්න. එසේ තිබෙනවා නම් එම කාමරවල ඉනනා අයගේ හිතුවක්කාරකම වර්ධනය විය හැකිය. එවිට ඔබ කළ යුත්තේ දරුවාව වෙනත් කාමරයකට යැවීමය. එසේත් නැතිනම් කාමරයේ දොර සහ ටොයිලට් එකේ දොර පඩිපෙල අතර වින්ඩ්වයිම් නැමැති සීනුව එල්ලන්න.

අපි හිතමු ඔබේ දරුවා යොවුන් වියට පත්වූ නමුත් අකීකරු නිවසට පැමිණීමට කැමති නැති, පවුලට සංවේදී බවක් නැති දරුවෙක් කියලා. එවිට ඔබ ඔහුගේ/ඇයගේ නිදන දිශාව පරීක්ෂා කර බැලිය යුතුය. ඉන්පසුව ඔහුගේ/ඇයගේ කුවා අංකයට අනුව ඔහුගේ/ඇයගේ 'නයින් යෙන්' දිශාව දැනගෙන එම දිශාවට හිස යොමු කර නිදාගැනීමට දරුවා පොළඹවන්න. මෙය පවුලට බද්ධ දිශාවයි. එබැවින් විශාල වෙනසක් ඇතිකරයි. මෙම ගුරුකම භාවිතා කිරීමෙන් හිතුවක්කාර දරුවන් ඔබට පහසුවෙන්ම හසුරුවා ගත හැකිය.

එමෙන්ම බිම නිදාගැනීමට ඔබේ දරුවන්ට ඉඩ නොදෙන්න. මෙය ඔවුන්ගේ පුද්ගලික වාසනාවට ශුභ නොවේ. එමනිසා සැමවිටම ඇඳක් මත් ඔවුන්ව නිදිකරවන්න. බිම නිදාගැනීම නිසා ඔවුන් ඉක්මනින් කලබලයට පත්වෙන අතර බිම නිදාගැනීම ඔවුන්ගේ සෞඛ්‍යයටද ශුභ නැත.

37 ලිටෙන්

දරුමල්ලන්ගේ කටයුතු කිරීම අසල්වැසි සමාජිකයන් සමඟ ජාතිබේදයකින් තොරව වැඩ කටයුතු කිරීම උපන් දින සැමරුම් නිවාඩු ඇති සෑම අවස්ථාවලම ඔවුනොවුන් එකතු වී අන්‍යොන්‍ය සහයෝගයෙන් කටයුතු කිරීම භෝජන සංග්‍රහ පැවැත හොඳින් මැනවින් කරන බව පෙනේ. එසේම මේ රටේ වැඩ සිටින භික්ෂූන් වහන්සේලා අතිනුත් ඊට අවශ්‍ය උපදෙස් අනුශාසනා ලැබෙන බවද පෙනේ. එසේම කලා කටයුතු නාට්‍ය - නර්තන - සංගීත - වාදන - සරඹ ක්‍රීඩා ආදිය පුහුණු කිරීම්, ඉංග්‍රීසි - සිංහල - දෙමළ - ප්‍රංශ ඕස්ට්‍රේලියන් ආදී භාෂා පුහුණු කිරීම් , වෙළඳ ව්‍යාපාර ආදී කටයුතු ද මැනවින් ඉටුකර බවද පෙනේ.

මේ අවිනිශ්චිත ලෝකයේ හැකි තරම් යහපත් විදියට - අනුන්ට කරදරයක් හිරි හැරයක් නැති විදියට ජිවත්වන්නට උත්සාහ කිරීම ශ්‍රද්ධාන්විතය. " ඇත්ත නැතත් සුදනෙන් පරලොව යාමක්" ආදී ලෝ වැඩ සඟරාවේ කවියක්ද තිබුණු බව ටිකක් සිහිපත් වෙයි. මෛත්‍රියෙන් - කරුණාවෙන් - මුදිතාවෙන් - උපේක්ෂාවෙන් යන සතර බඹ විහරණයෙන් යුක්තව වාසය කිරීම කොයි එකටත් හොඳය වැඩ දායකය. එමනිසා මේ සිංහල අවුරුදු උත්සවය සමරන අවස්ථාවේ එවැනි අදිටනික් ඇති කර ගැනීම හැම අතින්ම වැඩ දායකය. තම තමන්ගේ යුතුකම් සිගාලෝවාද සුත්‍රය - පරාභව සුත්‍රය - මහා මංගල සුත්‍රය - කරණීය මෙත්ත සුත්‍රය - රතන සුත්‍රය +- ධජග්ග සුත්‍රය ආදී සුත්‍ර වලින් මනාව පැහැදිලි කර දී තිබෙන නිසා සිංහල බෞද්ධයන් වන අපට ප්‍රශ්නයක් නැත. ඒ අනුව ජිවිතය ගෙන යාමට උත්සාහ කිරීම මහන්සි ගැනීම ප්‍රඥගොචරය - නුවණට හුරුය. පැරණි පඬිවරයෙක් මෙසේද ප්‍රකාශ කර තිබේ.

සකෘත දුජ් කෘතං චෙව ගවජනති
මනගවජාති භවිතව්‍ය භවතෙ‍ය්‍යච
කර්මරූ මිදතශි ගති - කළ නොකළ හොඳ නරක
පමණක් පරලොව .... වෙන දෙයක් සිදුවෙන
වෙලාවට සිදුවුණා වේ කියා සිත හදා ගෙන යාමයි.

බක්මහ උළෙලට ශකුරා වර්ෂය යන ව්‍යවහාරයක් ද පවතී. ඒ අනුව ජ්‍යොතිශ් ශාස්ත්‍රයින් අවුරුදු නැකත් චාරිත්‍ර ආදිය පැවැත්වීමට අවශ්‍ය සියලුම නැකත් සාදා දීමට උත්සුක වන බවක්ද අපට දක්නට ලැබේ. මේ නැකැත් එක එක ක්‍රමයට සාදා එක එක වේලාවල් නියම කර ගැනීමට පටන් ගැනීම නිසා ලක් රජය කොමිටියක් පත්කර සෑම දෙනාම එකම ක්‍රමයක් කළ යුතුය යන නිගමනයක් කළ නිසා දැන් ඒ අවුල නැත. ශ්‍රීමත් ශාලිවාහන ශතරාජ වර්ෂ යනුවෙන් සංවත්සරය පත්‍රයක් ද සාදා එම වර්ෂය තුළ පොදුවේ ශ්‍රී ලංකාවට සිදු වන ග්‍රහචාරය විස්තර කර තිබේ. ඒවා පැරණිම පංචාංග ලිත වන ඈපා පංචාංග ලිතෙන් ලංකා ග්‍රහස්ඵුට පංචාංග ලිතෙත් - ඉරණම පංචාංග ලිතේත් දක්වා ඇත. ශකරාජ වර්ෂය නම් මට දැන් හරියට මතක නැත. දළ ක්ෂේත්‍ර ක්‍රමය හා භාව ක්ෂේත්‍ර ක්‍රමය යනුවෙන් ක්‍රම දෙකක් හා දැන් විද්‍යා හා තාක්ෂණ ක්‍රම දියුණුව ඇති නිසා පරිගණක (කොම්පියුටර්) මඟින්ද පලාපල කීමට පටන්ගෙන තිබේ. ඕස්ට්‍රේලියාවේ ජිවත්වන අපේ සිංහල - දෙමළ අයද එකට එකතු වී සමගියෙන් හා සහජීවනයෙන් කටයුතු කිරීමට උත්සාහ කරන බව ගිම්හාන රංගන, වැනි උත්සව අවුරුදු පතා සංවිධානය කිරීමෙන් පෙනේ. එපමණක් නොව "බක්මහ උළෙල" නමින් පොත් පත් පවා ලියා "සන්නස" ආදී පුවත්පත් මඟින් ද විශාල සේවාවක් සිදු කරන අතර පන්සල් වල පිහිටුවා තිබෙන දහම් පාසල් මඟින් ද අවුරුදු උත්සව සංවිධානය කිරීම දකින්ට ලැබීම මහත් සතුටට කාරණයකි.

කතෝලික - ක්‍රිස්තියානි සිංහල අයටද මේ අවුරුදු උත්සවය පැවැත්වීමට බාධාවක් නැත. සමහරවිට කේන්දර බැලීම් නැකැත් බැලීම් ආදී දේ ඒ අය අනුගමනය නොකළත් මා කලින් කී පරිදි සූර්යයා මුල් කර ගෙන පවත්වන උත්සවයක් නිසා සිංහලයින් කවුරුත් එකතු වී මෙම අවුරුදු උත්සවය පැවැත්වීම කාලෝචිතය. වර්තමාන අපේ දරුවන්ටත් අනාගතයේ ඇති වන දරුවන්ටත් මෙම සිංහල අවුරුදු උත්සවය - වෙසක් උත්සවය වැනි උත්සව පැවැත්විය යුතුය. ක්‍රිකට් ක්‍රීඩාව - පාපන්දු ක්‍රීඩාව වැනි ක්‍රීඩාද පුහුණු කරන සංවිධාන ද ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් - ඇඩිලේඩ් - කැන්බරා - සිඩ්නි ආදී නගරවලත් දැන් ක්‍රම ක්‍රමයෙන් බිහිවීම සතුටට කාරණයකි. එසේම අපේ සිංහල අය අනිත් ජාතීන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම ලෝකයටම ආදර්ශයක් වනු නියතය.

සුබ අලුත් අවුරුද්දක් වේවා !